# සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 ප්‍රකාර ඉදිරියේදී සිදු කිරීමට නියමිත වියදමක් වෙනුවෙන් උපචිත වියදම් වෙන් කිරීමේදී එම වියදමට අදාල බැදීම විශ්වාසවන්ත ඇස්තමේන්තුවක් තුලින් පැන නැගුණු එකක් විය යුතු නමුත් , මණ්ඩලය මගින් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වෙන් කර ඇති රු.111,571,290 ක උපචිත වියදම් එකී ගිණුම් ප්‍රමිතිය ප්‍රකාර විශ්වාසනීය ඇස්තමේන්තු මත සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂ 3 ක කාලයක් සඳහා උපචිත වියදම් වෙන් කිරීම් හා සත්‍ය වියදම අතර පැවති විචලනය පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

| වර්ෂය | උපචිත වියදම් සඳහා වෙන් කිරීම | සත්‍ය වියදම | වැඩියෙන් වෙන් කිරීම් කර තිබූ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2008 | 137,122,097 | 83,252,520 | 53,869,577 |
| 2009 | 164,948,648 | 148,566,745 | 16,381,903 |
| 2010 | 50,672,602 | 49,348,882 | 1,323,720 |

## 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය මගින් 2005 සැප්තැම්බර් 23 දින රු.421,199,000 ක් ගෙවා මිලට ගෙන තිබූ ගොඩනැගිල්ලක් සහිත ඉඩමේ ගොඩනැගිල්ලේ වටිනාකම වෙනම ගණන් බලා ගොඩනැගිලි වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සැලසිය යුතු නමුත් , එම වටිනාකම වෙනම හඳුනාගැනීමකින් තොරව ඉඩම් සහ ගොඩනැගිලි ලෙස ගිණුම් වල දක්වා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර , පසුව අදාල ගොඩනැගිල්ල පිළිසකර කිරීම සඳහා වැයකර තිබූ රු.184,306,554 ක ප්‍රාග්ධන වියදම සඳහා පමණක් 10% බැගින් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) ලොතරැයි විකුණුම් නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත තබා තිබූ රු.23,934,881 ක ආරක්ෂක ඇප තැන්පතුවක සහ එම තැන්පතුව වෙනුවෙන් මණ්ඩලය වෙත ලැබී තිබූ රු.21,016,706 ක සමුච්චිත පොලියද යොදවාගෙන මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණු රු.44,951,587 ක ස්ථාවර තැන්පතුව වෙනුවෙන් වාර්ෂිකව ලැබෙන පොලී ආදායමට ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණ.

(ඇ) 2012 පෙබරවාරි මාසයේදී රු.16,000,000 ක් වැය කර මණ්ඩලය මගින් මිලට ගෙන තිබ වාහන 04 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් වලට හර කර ගෙවිය යුතු වියදම් ගිණුමට බැර කිරීම නිසා එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ වත්කම් හා බැරකම් වැඩියෙන් ගිණුම්වල පෙන්නුම් කෙරිණි.

(ඈ) මණ්ඩලය මගින් රු.42,965,051ක් වැය කර 2009 වර්ෂයේදී ඉදිකර තිබූ චිත්‍රාගාරයක් ස්ථාවර වත්කම් ලෙසද, එම ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ රු.33,491,297ක බැරකම් ලෙස ද ගිණුම් වල හෙළදරව් කර නොතිබණි.

(ඉ) 2008 වර්ෂයේ දැයට කිරුළ පදර්ශනයේ ටිකට්පත් වෙනුවෙන් ත්‍යාග පිරිනැමීම සඳහා මිලට ගෙන තිබූ එකතුව රු.12,553,360 ක් වූ පිඟන් කට්ටල 332 ක් හා තේ කෝප්ප කට්ටල 1,789 ක භෞතිකව ගබඩාවේ තිබුණ ද , එම වටිනාකම් ගිණුම් වල හෙළදරව් කර නොතිබුණි.

### 1.2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට වඩා පැරණ රු.7,496,220 ක් වූ ණය ගැති ශේෂ 02 ක් අය කර ගැනීම හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට කල ගෙවීම් යටතේ දැක්වෙන රු.1,539,985 ක් වූ ගිණුම් ශේෂ 06 ක් 2007 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ ද , එම ගෙවීම් වලට අදාල කාර්යයන් ඉටුකර ගැනීමට හෝ අදාල ඉදිරි ගෙවීම් ආපසු අයකර ගැනීමට හෝ ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

### 1.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම</u>

පහත සඳහන් ගිණුම් විෂයයන් ඊට ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලොතරැයි අලෙවි කුටි | 43,826,514 | i. ස්ථාවර වත්කම් ලේඛන<br>ii. භෞතික සමීක්ෂණ වාර්තා |
| (ආ) | ලොතරැයි මුද්‍රණ වියදම් | 175,754,473 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල බවට සාක්ෂි |
| (ඇ) | දෙවන වරම සංකල්පය හඳුන්වා දීමේ වියදම් | 1,942,080 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල බවට සාක්ෂි |

## 1.2.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | |
| i. 18 (1) සහ (2) වගන්ති | පනතේ වගන්ති ප්‍රකාර මණ්ඩලය මගින් පවත්වන සෑම ලොතරැයියකටම අදාල ආදායම් වලින් ලොතරැයි පැවැත්වීම සඳහා අදාල වන වියදම් හා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වියදම් හැර අනෙකුත් මුදල් ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු නමුත් , එම නියමයන්ට අනුකූල නොවී සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලය මගින් ගොඩනැගිලි ක්ෂය ප්‍රතිපාදනයට අමතරව රු.35,218,000 ක මුදලක් ගොඩනැගිලි ප්‍රතිශ්ඨාපන අරමුදලක් වෙත රඳවා ගෙන තිබුණි. |
| ii. 19 (1),(2) සහ (3) වගන්ති | නියමිත යැයි පනතින් ප්‍රකාශිත හෝ බලය දී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් රීති සෑදීමට ඇති සියලු කරුණු සම්බන්ධයෙන් හෝ රීති පැනවීමට මෙම පනතින් බලය පැවරී ඇති අතර, එම රීති පිළයෙල කර අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කල යුතු නමුත්, අදාල වගන්තිය ප්‍රකාර පවත්වන ලොතරැයි සම්බන්ධයෙන් හා මූල්‍ය හා මෙහෙයුම් සම්බන්ධයෙන් මණ්ඩලය මගින් අදාල රීති පනවා ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. |
| (ආ) 2008 දෙසැම්බර් 17 දිනැති අංක එම්එෆ2/2/ඩීඑල්බී/ටීඊඑන්ඩී 02 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය හා අංක 08/2356/306/145/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාර ක්ෂණික ලොතරැයි මුද්‍රණය සඳහා 2009 වර්ෂයේදී ඉන්දියානු සමාගමකට වසරක කාලයක් සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය දක්වාම අදාල සමාගමෙන් ලොතරැයිපත් මිලට ගෙන තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ vii | වැඩ බැලීම සඳහා විධිමත් ලෙස පත් කර නොතිබූ නිලධාරියෙකුට අදාල අනුමැතිය ලබා නොගෙන |

| | | |
|---|---|---|
| | පරිච්ඡේදයේ 12:2:5 හා 12:2:6 වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ පමණක් රු.90,000 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරන සේවා චක්‍රලේඛයේ (ඇ) වගන්තිය | මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තොරතුරු තාක්ෂණ විධායක තනතුරක් 2010 ජූලි 01 දින සිට ඇති කර ඒ සඳහා මාසිකව රු.25,000 බැගින් රු.300,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 ජේදය | සමාලෝචිත වර්ෂය තුල මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා වැය කර තිබූ රු.971,238 ක වියදම් වලට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

### 1.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ ලොතරැයි මෘදුකාංග පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා රු.1,504,500 ක මුදලක් ගෙවා තිබූ අතර , මෙම ගෙවීමට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කිරීමක් හෝ ලිඛිත ගිවිසුම් වලට එළඹීමක් සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් වලින් ජනාධිපති අරමුදල වෙත ප්‍රතිපාදනය කල හැකි මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 1,489.93 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ජනාධිපති අරමුදලට ප්‍රතිපාදනය කල හැකි වූ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 1,081.98 ක අතිරික්තයක් වූයෙන් ජනාධිපති අරමුදල වෙත ප්‍රතිපාදනය කල හැකි මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 407.95 ක නොහොත් 37.70 % ක වර්ධනයක් දැක්විණි. තවද, ජයග්‍රහණය කර තිබූ නමුත් ත්‍යාගලාභීන් ඉදිරිපත් නොවීම නිසා ඉකුත් වර්ෂයේ රු.මිලියන 144.07 ක් නැවත ලාභයට එකතු කර තිබුණු අතර , එම ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 174.30 ක්ව තිබූ බැවින් රු.මිලියන 30.23 ක් නොහොත් 20.98 % කින් එම අගය වැඩි වී තිබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය පිළබඳව විග්‍රහයක් පහතන් දැක්වේ.

| | විචලනය | | |
|---|---|---|---|
| | වාසිදායක | අවාසිදායක | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **ආදායම** | | | |
| ලොතරැයි විකුණුම් ආදායම | 1,216.46 | | |
| වෙනත් ආදායම් | | 32.86 | |
| ජයග්‍රාහකයන් ඉදිරිපත් නොවූ ත්‍යාග මුදල් ආපසු ලාභයට එකතු කිරීම | 30.25 | | |
| | 1,246.71 | 32.86 | 1,213.85 |
| **වියදම්** | | | |
| ලොතරැයි වියදම | | 54.75 | |
| ත්‍යාග ප්‍රදානය කිරීම් | | 713.96 | |
| දිනුම් ඇදීමේ වියදම් | | 1.05 | |
| පරිපාලන වියදම් | | 40.07 | |
| ප්‍රචාරණ හා බෙදාහැරීමේ වියදම් | 24.92 | | |
| මූල්‍ය වියදම් | 2.40 | | |
| බදු | | 23.39 | |
| | 27.32 | 833.22 | 805.90 |
| | | | 407.95 |

(ආ) <u>අනුපාත සහ ප්‍රතිශතයන්</u>

| | වර්ෂය | |
|---|---|---|
| | **2010** | **2011** |
| (I) **ලාභදායිත්ව අනුපාත** | | |
| i. ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 16.5 | 19.1 |
| ii. ස්කන්ධය මත ප්‍රතිලාභ | 120.2 | 142.7 |
| iii. සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 69.9 | 83.0 |

| | | |
|---|---|---|
| (II) **ප්‍රාග්ධන** | | |
| i. ස්කන්ධය/මුළු වත්කම් | 69.9 | 83.0 |
| ii. ස්කන්ධය/ජංගම නොවන වත්කම් | 0.58 | 0.58 |
| (III) **ද්‍රවශීල වත්කම්** | | |
| i. ජංගම වත්කම් අනුපාතය | 0.49 | 0.61 |
| ii. ක්ෂණික (ද්‍රවශීල) වත්කම් අනුපාතය | 0.39 | 0.55 |

මණ්ඩලයේ ලාභදායීත්ව අනුපාත ඉකුත් වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කර තිබූ නමුත් , ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික අනුපාතය තවදුරටත් අපේක්ෂිත මට්ටම්වල නොපැවති බැවින් වත්කම් කළමනාකරණයේ සැලකිය යුතු දුර්වලතාවයන් පැවති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 18 (1) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ අනුමත වියදම් හා අමාත්‍යවරයා විසින් නියම කරන වියදම් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල් ජනාධිපති අරමුදල වෙත බැර කළ යුතු නමුත් , මණ්ඩලය ආරම්භයේ සිට මේ දක්වා එසේ බැර කල යුතු මුදලට වඩා අඩු මදලක් අදාල අරමුදල වෙත බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 3 ක කාල පරිච්ඡේදය තුල එසේ අඩුවෙන් බැර කර තිබූ මුදල් පිලිබඳ විස්තර පහත පරිදි විය.

| වර්ෂය | ඉදිරියට ගෙන ආ බැර කළ යුතු ශේෂය | පනත ප්‍රකාර අරමුදල් වෙත බැර කළ යුතු මුදල | අරමුදල් වෙත බැර කළ මුදල | තවදුරටත් බැර කළ යුතු මුදල |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2008 | 20 | 720 | 656 | 84 |
| 2009 | 84 | 715 | 735 | 64 |
| 2010 | 64 | 973 | 889 | 148 |
| 2011 | 148 | 1,468 | 1,446 | 170 |

## 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී රු. 42,965,051 ක් වැයකර ඉදිකර තිබූ චිත්‍රාගාරයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණ අතර , එම චිත්‍රාගාරය වෙනත් ආදායමක් උපයාගත හැකි මාර්ගයක් වෙත යෙදවීම කෙරෙහිද අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2009 අප්‍රේල්, නොවැම්බර් හා 2010 මාර්තු මාස වල මණ්ඩලය මගින් මිලට ගෙන තිබූ රු.4,718,504 ක් වටිනා පරීක්ෂණ කැමරා පද්ධතියක් 2010 නොවැම්බර් 15 දින සිට 2012 මාර්තු 26 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

(ඇ) 2009 දෙසැම්බර් මස රු. 3,222,094 ක් වැය කර මුද්‍රණය කර තිබූ ක්ෂණික ලොතරැයිපත් 2,411,750 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ගබඩාවේ තිබූ අතර ඒවා නියෝජිතයන් වෙත ඉතා සෙමින් නිකුත් කර තිබුණි.

## 3.3 හඳුනාගත් පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශනිදා වාසනාව , සංවර්ධන වාසනාව, ජනජය හා දැයට කිරුළ ලොතරැයි මුද්‍රණය සඳහා ටෙන්ඩර් කැඳවීමකින් තොරව පෞද්ගලික සමාගමකින් මුද්‍රණය කර ගැනීමේදී එක් ලොතරැයි පතක් සඳහා ශත 56 බැගින් ගෙවා තිබූ අතර , ටෙන්ඩර් කැඳවීමෙන් මිල ගණන් තීරණය කර තිබූ ජයෝදා ලොතරැයි පතක් ශත 48 බැගින් මුද්‍රණය කරවාගෙන තිබුණු බැවින් , ටෙන්ඩර් කැඳවීමකින් තොරව ටිකට් මුද්‍රණය කිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල පමණක් මණ්ඩලයට රු.24,385,865 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) 2008 දෙසැම්බර් 17 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ එම්එෆ2/2/ඩීඑල්බී/ටීඊඑන්ඩී 02 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ උපදෙස් ප්‍රකාර දේශීය සමාගමකින් ක්ෂණක ලොතරැයිපත් මුද්‍රණයට කටයතු නොකිරීම නිසා රු.40,697,200 ක අලාභයක්ද, ඊට අමතරව සෙස් බද්ද වෙනුවෙන් රු.38,466,600 ක් හා රේගු බදු වෙනුවෙන් රු.14,483,186 ක අමතර පිරිවැයක්ද, සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් සහ සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් , අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මානව සම්පත් කළමනාකරණය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) වියදම් කළමනාකරණය